# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,465 - 2025 නොවැම්බර් මස 28 වැනි සිකුරාදා - 2025.11.28**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී. )

## II කොටස - අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත. )

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... | 422 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... | — |
| නොතාරිස් ලැයිස්තුව ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 දෙසැම්බර් මස 05 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 නොවැම්බර් මස 22 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය. "

2025 ජුනි මස 09 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**එස්. ඩී. පාඩිකෝරාල,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

මෙම *ගැසට් පත්‍රය* www. documents. gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

**මාරවිල දිසා අධිකරණයේ දී ය**

පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

මහජන බැංකුව,
ප්‍රධාන කාර්යාලය,
අංක 75,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,
කොළඹ 02.

*නව ලිපිනය :*

මහජන බැංකුව,
ප්‍රධාන කාර්යාලය,
අංක 374,
ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත,
කොළඹ 02.

නඩු අංකය : 434/MB
ඇස්කිසි අංකය : 38/2025

*............පැමිණිලිකරු.*

*එදිරිව*

1.වර්ණකුල පටබැඳිගේ ඇන්ටනි අරුණ ශ්‍රී මේඝවර්ණ පෙරේරා,
සිරි නිවස, මාරවිල.

*සහ*

අංක 04, සිරි නිවස, මාරවිල.

"ඇටර්නි බලකරු",
වර්ණකුල පටබැඳිගේ ජෝශප් නෙම්සන් ඩෙනිස් පෙරේරා,
සිරි නිවස, මාරවිල.

*සහ*

අංක 04, සිරි නිවස, මාරවිල.

*............විත්තිකරු.*

මාරවිල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ වර්ෂ 2024.01.31 දින ප්‍රකාශයට පත්කරන ලද සමථ තීන්දුව ප්‍රකාරව 434/MB දරන නඩුව සඳහා ඉහත නම් සඳහන් විත්තිකරු එකඟ වූ රු. 4,337,231.76 ක මුදල ගෙවීම පැහැර හැර විත්තිකරු සමථය කඩකර ඇති බැවින් එකී සමථය ප්‍රකාරව පැමිණිල්ලේ ආයාචනයේ දැක්වෙන පරිදි විත්තිකරුගෙන් පැමිණිලිකරුට අයවිය යුතු පළමු නඩු නිමිත්ත මත 2022.03.29 දිනට රු. 2,223,109.00 ක මුදලක් සහ රු. 2,065,998.73 ක මුදල මත 2022.03.29 දින සිට 16.5% ක වාර්ෂික පොළී අනුපාතිකය මත සම්පූර්ණ මුදල ගෙවනු ලබන දින දක්වා පොළියක් ද, දෙවන නඩු නිමිත්ත මත 2022.03.29 දිනට රු. 1,040,263.58 ක මුදලක් සහ රු. 860,000.00 ක මුදල මත 2022.03.29 දින සිට 17.5% ක වාර්ෂික පොළී අනුපාතිකය මත සම්පූර්ණ මුදල ගෙවනු ලබන දින දක්වා පොළියක් සහ වෙන්දේසි ගාස්තු අයකර ගැනීම සඳහා මෙම අධිකරණය මගින් නිකුත් කර ඇති ඇස්කිසි ආඥාව ප්‍රකාරව තහනමට ගෙන ඇති මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති නිශ්චල දේපළෙහි එම විත්තිකරුවන්ට අයත් සියලුම හිමිකම් හා අයිතිවාසිකම්,

**වර්ෂ 2026 ක් වූ ජනවාරි මස 09 දින පෙ. ව. 11.00 ට,**

දේපළ පිහිටි ස්ථානයේ දී රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව සියල්ලන්ට ම මෙයින් දැනුම් දෙනු ලැබේ.

*ඉඩමට පිවිසීම.*- මාරවිල මහජන බැංකු ශාඛා පරිශ්‍රයේ සිට A3 මාර්ගයේ හලාවත දෙසට මීටර් 700 ක් පමණ යන විට හමුවන හොරගොල්ල හන්දියෙන් වමට ඇති ප්‍රනාන්දු පාරේ මීටර් 800 ක් පමණ ගියවිට තුන්මං හන්දියෙන් දකුණට ඇති පාරේ මීටර් 400ක් පමණ ගියවිට එම පාරට මායිම් ව පාරේ වම්පස පිහිටි දේපල, වෙන්දේසි කිරීමට නියමිත දේපළ වේ.

### උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයට අයත්, දකුණු පිටිගල් කෝරළේ, යටකලන්පත්තුවේ, නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා සීමාව තුළ, මහවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, මාරවිල දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයට අයත්, මාරවිල නැමැති ගමේ පිහිටි "පරගහයාය නෙරියවත්ත" නමැති ඉඩමට, වී. බාලචන්ද්‍රන් බලයලත් මානක තැන විසින් 2008.02.17 වන දින මැන බෙදා වෙන් කොට 2008.02.22 දින සාදන ලද අංක 257 දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 1 දරන ඉඩමට මායිම්,

උතුරට : එම්මානුවෙල් දබරේරා සහ ඇන්ටනි දබරේරා ට අයිති ඉඩම,
නැගෙනහිරට : තලවිල පාර,
දකුණට : මෙම පිඹුරේ ලොට් 2 දරන කොටස,
බස්නාහිරට : සී. පෙරේරා යන අයට අයිති ඉඩම,

යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් දෙකයි, පර්චස් දහතුනයි දශම නවය (රූඩ් 02, පර්චස් 13.9) ක් විශාල ඉඩමේ බිම සහ ඒ තුළ පිහිටි, ගහකොළ, පලතුරු, ගොඩනැගිලි ආදී සෑම සියලු දේත් මේ සමග වේ.

ඉඩමේ ප්‍රමාණය : රූඩ් 02 , පර්චස් 13.9)

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
ගරු දිසා අධිකරණය,
මාරවිල.

වර්ෂ 2025ක් වූ නොවැම්බර් මස 06 දින දී ය.

11-423

---

### වැල්ලවාය දිසා අධිකරණයේ දී ය

### පිස්කල් වෙන්දේසියේ විකිණීමේ දැන්වීමයි

සණස ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී,
සීමාසහිත සණස සංවර්ධන බැංකුව යන නාමයෙන් ද හැඳින්වේ.
අංක 12, එඩ්මන්ටන් පාර,
කිරුළපන, කොළඹ 06.
(එහි ශාඛාවක් මදුරප්පෙරුම ගොඩනැගිල්ල,
කතරගම පාර, බුත්තල පිහිටා ඇත.)
*............පැමිණිලිකරු.*

නඩු අංකය : MB/77
වැල්ලවාය දිසා අධිකරණ
ඇස්කිසි අංකය : 22/2025

*එදිරිව*

1. සාමසුන්දර මුදියන්සේලාගේ ජනිත මධුරංග,
   09 කණුව, උනවටුන,
   බුත්තල.

*.............විත්තිකරු.*

වැල්ලවාය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ උගත් දිසා විනිසුරු තැන්පත් චතුර දිසානායක මැතිතුමන් විසින් වර්ෂ 2023.03.20 දින ප්‍රකාශයට පත් කරන ලද ඒක පාර්ශ්වික තීන්දු ප්‍රකාශය ප්‍රකාරව පැමිණිල්ලේ ආයාචනයේ අයැද සිටින පැ. 7 දරන ගිණුම් ප්‍රකාශය අනුව වර්ෂ 2019.07.08 වන දින වන විට රුපියල් විසිහතර ලක්ෂ හැටහත් දහස් තුන්සිය අසූ නවයයි ශත දහනවයක (රු. 2,467,389.19) ක මුදලක් ද, ඒ මත එකී දින සිට එකී මුදල් ගෙවා අවසන් වන දින තෙක් වර්ෂයකට 20% බැගින් ස්ථාවර පොළියක් සහ අනෙකුත්

වියදම් ගාස්තු අයකර ගැනීම සඳහාත්, පැ. 06ක් වශයෙන් සලකුණු කර ඇති උකස් ඔප්පුව බලාත්මක කරවා ගැනීම සඳහා විත්තිකරුට එරෙහිව පැමිණිලිකරුට අයිතිවාසිකම් පවතින බව ද, ඒ අනුව පැමිණිල්ලේ ආයාචනයේ අයැද ඇති අ, ආ, ඇ යටතේ වූ සහන ඇතුළුව නඩු ගාස්තු ද අයකරවා ගැනීමට පැමිණිලිකරුට හිමිකම පවතින බවට තීන්දුව ප්‍රකාශ කර ඇති බැවින්,

එකී තීන්දුව ඉටු කිරීමට විත්තිකරු විසින් අපොහොසත් වී පැහැර හැර ඇති බැවින්, එකී මුදල් අයකර දීම සඳහා වැල්ලවාය දිසා අධිකරණ නඩු අංක MB/77 දරන නඩුව යටතේ නිකුත් කර ඇති ඇස්කිසිය ප්‍රකාරව, වැල්ලවාය දිසා අධිකරණයේ රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල් පී. එස්. එම්. අයි. අනුරංගි වන මා විසින් වර්ෂ 2025ක් වූ ජූලි මස 25 දින නිසිලෙස තහනම් කරන ලද විත්තිකරුට අයත් මෙහි පහත උපලේඛනයේ සඳහන් නිශ්චල දේපළ,

**වර්ෂ 2025 ක් වූ දෙසැම්බර් මස 23 දින පෙ. ව. 11.00 ට,**

එකී නිශ්චල දේපළ පිහිටා ඇති ස්ථානයේ දී, මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් ප්‍රසිද්ධ කොට ප්‍රකාශ කරනු ලැබේ.

වෙන්දේසියේ දී ඉහළම ලංසු තබන්නා ගැණුම්කරු වන අතර, වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින්,

01.මුළු ගැණුම් මුදලින් 25% ක මුදලක් ද,
02. සිවිල් නඩු විධාන සංග්‍රහයේ 258 වගන්තිය යටතේ අයකිරීම් ද,

විකිණීම අවසන් වූ වහාම මුදලින් මා වෙත (වෙන්දේසිකරු) ගෙවිය යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ. ගැණුම් මිලෙන් ගෙවන ලද්දේ 25% ක මුදලක් පමණක් නම්, ගැණුම් මිලෙන් ඉතිරි මුදල වන 75% ක මුදල දින 30ක් ඇතුළත වැල්ලවාය, දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත් කළ යුතුය.

**උපලේඛනය**

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, බුත්තල ප්‍රාදේශීය සභා බල සීමාවේ, බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බුත්තල කෝරළයේ, මැදගම ග්‍රාම නිළධාරි වසමේ, මැදගම ගමෙහි පිහිටි "උඩුමුල්ලේ අලුත් ගෙදර වත්ත" නැමැති ඉඩමට බලයලත් මානක ඩී. එම්. ඩබ්. බී. දිසානායක විසින් 2018.08.05 දින මැන සකස් කරන ලද අංක 5351 දරන පිඹුරෙහි කැබලි අංක 01 න් නිරූපිත ඉඩමට මායිම්, උතුරට : පී. ඩබ්. නන්දසේන මානකගේ අංක 2938 දරන පිඹුරේ කැබලි අංක 01 ද, නැගෙනහිරට : ඩබ්. ආර්. ගුණරත්න, ඒ. එම්. දිසානායක, ජේ. එම්. වසන්ත හිමිකම් කියනු ලබන ඉඩම ද, දකුණට : පී. බී. ඉලංගසිංහ මානකගේ අංක MO/5459 පිඹුරේ කැබලි අංක 01 ද, බස්නාහිරට : පාර ද, යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් හතයි දශම පහයි හයක් (රූ. 02, පර්. 7.56) *නොහොත්* හෙකටයාර් 0.2215 විශාල ඉඩම සහ ඊට අයත් එහි සෑම සියලු දේත් එකී ඉඩමට පිවිසීම සඳහා වූ ප්‍රවේශ මාර්ග අයිතිය ද සමඟ වේ. (මෙම ඉඩම මොණරාගල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ J 14/71 දරන පත්ඉරුවේ ලියාපදිංචි වී ඇත.)

*දේපළට පිවිසීම* : බුත්තල බස් නැවතුම්පළේ සිට කතරගම මාර්ගයේ කි. මී. 1.85ක් පමණ යන විට හමුවන හත්පෝරුව පන්සල පාර හංදියෙන් දකුණු පසට ඇති හත්පෝරුව පන්සල පාරට හැරී මී. 100 ක් යන විට දකුණු පසට ඇති අඩි 13ක් පළල බොරලු පාරට හැරී මී. 50ක් ඉදිරියට යන විට මාර්ගයේ දකුණු පස අදාළ දේපළ පිහිටා ඇත.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
වැල්ලවාය.

වර්ෂ 2025ක් වූ නොවැම්බර් මස 18 දින දී ය.

11-458

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.